**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව**

**පුත්තලම් දිස්ත්‍රික්කය**

## 1. මුල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 20 දින ද, ඉකුත් වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන 2014 මැයි 02 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජුලි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මුල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයත් ගොඩනැගිලි හයක වටිනාකම, බංගදෙනිය පුස්තකාලයට ලබාදී තිබූ රු.11,160 ක් වටිනා ජල මෝටරය හා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් මිලදීගෙන තිබූ රු.356,983 ක් වූ ඉතිරි උපාංග තොගයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සභාපතිවරයා විසින් 2015 වර්ෂයේදී සිදු කිරීමට යෝජිතව තිබූ විදේශ සංචාරයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණු රු.498,500 ක මුදල සමුච්චිත අරමුදල් ගිණුමට හර කිරීම හේතුවෙන් ජංගම වත්කම් හා පොදු සංචිත ගිණුම රු.498,500 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල මුදලින් ලැබී තිබූ රු. 6,396,788 ක මූලධන ආධාර ආදායමක් ලෙස ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට මූලධන ආධාර ගිණුමේ ශේෂය වූ රු.7,373,013 ක වටිනාකම ණයගැතියන්ගෙන් අඩුකර දැක්වීම හේතුවෙන් එම වටිනාකමින් මූල්‍ය ප්‍රකාශනවල ණයගැති ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ගිණුම් විෂයයන් 07 ක ශේෂයන්හි වටිනාකම ඊට අදාල උපයෝගී ලේඛන සමඟ නොසැසඳුන අතර, නොසැසඳුන වෙනසෙහි වටිනාකම රු.492,740 ක් විය.

### 1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

ආදායම් ණයගැති ශේෂය තුල ඇතුලත් වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවත එන රු. 3,950,537 ක හිඟ දේපල බදු ආදායමක් වූ අතර, ණයහිමි ශේෂය තුල ඇතුලත් වසරකට වඩා වැඩි ශේෂයන්ගේ වටිනාකම රු.4,296,898 ක් විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.4,873,960 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.2,920,753 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුල පිළිවෙලින් රු.15,189,115ක් හා රු.5.820,813 ක්වූ මූලධන ආධාර හා පිළිවෙලින් රු.16,210,883 ක් හා රු.8,151,940 ක් වූ මූලධන වියදම් ගණන් ගැනීමෙන් පසු සභාවේ මූල්‍ය ප්‍රතිඵලය පිළිවෙලින් රු.3,852,192 ක් අතිරික්තයක් හා රු.589,626 ක අතිරික්තයක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු. 3,262,566 ක වර්ධනයක් සිදුව තිබුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**-----------------------------------**

**(අ)** ජංගම වත්කම්වලට ජංගම වගකීම් අනුපාතය 4:1 ක් වූ අතර, සම්මත අනුපාතය 2:1 ක් විය.

**(ආ)** ජංගම වත්කම් මුළු වටිනාකම රුපියල් මිලියන 48 ක් වූ අතර, එයින් රුපියල් මිලියන 40.5 ක්, එනම් දල වශයෙන් සියයට 84.3 ක් ආදායම් ණයගැතියන් විය.

**2.3 ආදායම් පරිපාලනය**

------------------------

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

---------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත හිඟයන් ලෙස වරිපනම් බදු රු.මි. 10.7 ක්ද, බදුකුලී රු.මි. 6.3 ක්ද, වෙනත් ආදායම් රු.මි. 28.5 ක්ද වශයෙන් පැවතුණි.

2.3.2 වරිපනම් බදු

---------------

සමාලෝචිත වර්ෂයේදී අනුකූලතා සහතික නිකුත් කළ වර්ග අඩි 23,885 ක්වූ නව ඉදිකිරීම් ඒකක 14 ක් සඳහා හා 2007 වර්ෂයෙන් පසු අනුකූලතා සහතික නිකුත් කළ කිසිදු ගොඩනැගිලක් සඳහා තාවකාලික තක්සේරුවක් මත හෝ වරිපනම් බදු අයකිරීමට කටයුතු නොකිරීමෙන් සභාවට පාඩු සිදුව තිබුණි.

**2.3.3 බදු කුලී**

---------

ආරච්චිකට්ටුව සතිපොලේ 2013 වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු.877,140 හිඟ බදුකුලි අයකර ගැනීම සඳහා ගිවිසුම් ප්‍රකාරව නිතීමය පියවර ගෙන නොතිබුණි.

**2.3.4 වෙනත් ආදායම්**

**-----------------**

2013 දෙසැම්බර් 20 දින ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදනය අනුව ප්‍රචාරක දැන්වීම් සඳහා බදු අයකිරීම පිළිබඳව ප්‍රකාශයට පත්කර තිබුණද, හලාවත පුත්තලම ප්‍රධාන මාර්ගය දෙපස සවිකර ඇති විශාල ප්‍රමාණයේ ස්ථිර දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම ඉකුත් වර්ෂයන්හීදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද සිදුකර නොතිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------------

පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව තිබූ උසාවි දඩ වටිනාකම රු. 9,312,684 ක් හා මුද්දර ගාස්තු වටිනාකම රු. 18,690,241 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 අධිභාර**

----------

ආරච්චිකට්ටුව සතිපොල ගාස්තු එකතු කිරීමේ අයිතිය 2005 වර්ෂයට බදුදීම වෙනුවෙන් අයකරගත යුතුව තිබූ රු.901,705 ක බදු මුදල් අයකර නොගැනීම සම්බන්ධයෙන් සභාවේ සභාපති ඇතුළු නිලධාරීන් වෙත විගණකාධිපතිවරයා විසින් 2011 මාර්තු 24 දින අධිභාර නිවේදනයක් නිකුත් කර තිබුණි. එම මුදලින් වාරික වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 113,100 ක් අයකරගෙන තිබූ අතර, රු. 788,605 ක් අයවීමට තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

(අ) ප්‍රාදේශීය සභා සීමාව තුල පිහිටි විථි පහන් කණු සංඛ්‍යාව නිශ්චිතවම ගණනය කර නොතිබුණ අතර, විථි පහන් කණු අළුත්වැඩියා ඉල්ලීම් /පැමිණිලි ලේඛනයක් පවත්වා නොතිබුණි. විදුලි කාර්මිකයින් විසින් දෛනිකව සිදුකරනු ලබන නඩත්තු කටයුතු පිළිබඳව වගකිවයුතු නිලධාරියකු වෙත ලිඛිතව වාර්තා කිරීමක් නොකෙරෙන අතර, කලින් නිකුත් කරන ලද විදුලි උපකරණ හා උපාංග යෙදවීම පිළිබඳ තහවුරු කර නොගෙන නැවත නිකුත් කිරීම්ද කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල විථිපහන් නඩත්තුව සඳහා දරන ලද වියදම රු. 998,686 ක් විය.

**(ආ)** බංගදෙනිය මහජන පුස්තකාලයේ පරිග්‍රහණ ලේඛනයේ ඇතුලත් රු.31,664 ක් වටිනා පොත් 204 ද , උඩප්පුව මහජන පුස්තකාලයේ පරිග්‍රහන ලේඛනයේ ඇතුලත් රු. 5,530 ක් වටිනා පොත් 88 ක් ද, 2014 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකිවීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී සභාවට සිදුව තිබූ පාඩුව රු. 37,194 ක් විය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 102 සිට මු.රෙ 110 දක්වා විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

------------------------

සභාව විසින් බැකෝ යන්ත්‍ර සේවා සඳහා දිස්ත්‍රික් මිල කමිටු තීරණයන්ට වඩා එක් පැයකට රු. 400 ක් බැගින් ගෙවීම හේතුවෙන් මීටර් පැය 47 වෙනුවෙන් ගෙවීම් කිරීමේදී සභාවට රු. 18,800 ක පාඩුවක් සිදුව තිබුණි.

**3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

-----------------------------------

රජයේ සේවයේ යේදී සිටියදී සිදුවන හදිසි අනතුරු සම්බන්ධයෙන් වන්දි ගෙවීමේදී අදාල වන චක්‍රලේඛ විධිවිධාන හා අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ වූ විධිවිධානද නොසලකා හැර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව සභාවේ විදුලි කාර්මිකයින් ලෙස සේවය කරන සේවකයින් දෙදෙනකු වෙත පුද්ගල නාමිකව ලබාගෙන ඇති ජීවිත රක්ෂණ ආවරණ වෙනුවෙන් වාර්ෂිකව රු.25,146 හා රු. 25,047 ක් බැගින් රු. 50,193 ක් ගෙවා තිබුණි.

**04. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ණයගැති හා ණයහිමි පාලනය